# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව පනත

---

[සහතිකය සටහන් කළේ 1987 දෙසැම්බර් මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 දෙසැම්බර් මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිල : රු. 1.50 ශ.　　තැපැල් ගාස්තුව : රු. 1.15 ශ.

# 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව පනත

[සහතිකය සටහන් කළේ 1987 දෙසැම්බර් මස 09 වන දින]

එල්.ඩී.—ඕ. 44/86

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව පිහිටුවීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලසීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක ක්‍රියාත්මක වන්නේ ය. — ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

## I වන කොටස

### ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව පිහිටුවීම

2. (මෙහි මින් මතු 'සභාව' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් මේ පනතේ විධිවිධානවලට අනුකූලව පිහිටුවනු ලැබිය යුතු ය. — ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව පිහිටුවීම.

3. සභාව, 2 වන වගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර ඒ නාමයෙන් එය විසින් හා එයට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය. — සභාව සංස්ථාවක් බව.

4. (1) සභාව පහත සඳහන් පරිදි, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන දහ හතරකට නොවැඩි සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය :— — සභාවේ සාමාජිකයෝ.

(අ) කෘෂිකාර්මික පර්යේෂණ විෂයය හෝ කෘෂිකාර්මික පර්යේෂණයට සම්බන්ධ යම් විෂයයක් හෝ භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ; ඒ විෂය වෙනත් යම් අමාත්‍යවරයකුට පවරා ඇති අවස්ථාවක ඒ අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව ;

(ආ) මුදල් හා ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයා විමසා එම අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(ඇ) 1981 අංක 78 දරන ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විමසා, ඒ අධිකාරියේ නියෝජිතයෙක් ;

(ඈ) ස්ථිර භෝගවලට සම්බන්ධ කෘෂිකාර්මික පර්යේෂණ ආයතනයක අධ්‍යක්ෂවරයෙක් වන තැනැත්තෙක් නැතහොත් එවැනි කෘෂිකාර්මික පර්යේෂණ ආයතනයක, කෘෂිකාර්මික පර්යේෂණය පිළිබඳ වගකීම දරන තැනැත්තෙක් ;

(ඉ) වාර්ෂික භෝගවලට සම්බන්ධ කෘෂිකාර්මික පර්යේෂණ ආයතනයක අධ්‍යක්ෂවරයෙක් වන තැනැත්තෙක් හෝ එවැනි කෘෂිකාර්මික පර්යේෂණ ආයතනයක කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු පිළිබඳ වගකීම දරන තැනැත්තෙක් ;

2—ඒ 098021—7,260 (87/07)

(ඊ) පශු සම්පත් නිෂ්පාදනය සම්බන්ධ පර්යේෂණ ආයතනයක අධ්‍යක්ෂවරයෙක් වන තැනැත්තෙක් හෝ එවැනි පර්යේෂණ ආයතනයක පර්යේෂණ කටයුතු පිළිබඳ වගකීම දරන තැනැත්තෙක් ;

(උ) වන විද්‍යාව සම්බන්ධ පර්යේෂණ ආයතනයක අධ්‍යක්ෂවරයෙක් වන තැනැත්තෙක් හෝ එවැනි පර්යේෂණ ආයතනයක පර්යේෂණ කටයුතු පිළිබඳ වගකීම දරන තැනැත්තෙක් ;

(ඌ) ධීවර කර්මාන්තයට සම්බන්ධ පර්යේෂණ ආයතනයක අධ්‍යක්ෂවරයෙක් වන තැනැත්තෙක් හෝ එවැනි පර්යේෂණ ආයතනයක පර්යේෂණ කටයුතු පිළිබඳ වගකීම දරන තැනැත්තෙක් ;

(එ) (289 වන අධිකාරය වූ) 1895 අංක 10 දරන ආඥාපනත යටතේ සංස්ථාගත කරන ලද ලංකා වාණිජ මණ්ඩලයේ පාලක මණ්ඩලය විමසා, ඒ මණ්ඩලයේ නියෝජිතයෙක් ;

(ඒ) රාජ්‍ය වැවිලි විෂයය භාර අමාත්‍යවරයා විමසා, කුඩා වතු හිමියන් නියෝජනය කිරීමට තැනැත්තෙක් ;

(ඔ) ජනතා වතු සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හා රාජ්‍ය වැවිලි විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විමසා, ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා රාජ්‍ය වැවිලි සංස්ථාව නියෝජනය කිරීමට තැනැත්තෙක් ;

(ඕ) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විමසා, විශ්ව විද්‍යාලවල කෘෂිකර්ම පර්යේෂණයෙහි ලා විශිෂ්ටත්වයට පත් තැනැත්තෙක් ;

(ක) සභාවේ නිර්දේශ කිරීම සහිතව විද්‍යාත්මක පර්යේෂණයෙහි හා කළමනාකරණයෙහි විශිෂ්ටත්වයට පත් තැනැත්තෙක් ; සහ

(ග) සභාවේ ලේකම්වරයා.

(2) මේ වගන්තියේ (ඈ) හා (ඉ) ඡේද ප්‍රකාර, සභාවට සාමාජිකයන් පත් කළ යුත්තේ සභාව විසින් සාදනු ලැබිය යුතු රීතිවලට අනුකූලව ඒ එක් එක් ඡේදයෙහි සඳහන් අධ්‍යක්ෂවරුන් හා අනෙකුත් තැනැත්තන් සමූහය අතර පැවැත්වෙන ඡන්ද විමසීමක ප්‍රතිඵල මත ය.

සාමාජිකයකු වීමට නුසුදුසු වීම.

5. යම් තැනැත්තකු පහත සඳහන් හේතු මත සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීමට හෝ එසේ කටයුතු කරගෙන යාමට හෝ නුසුදුසු විය යුතු ය :—

(අ) ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු නම් ;

(ආ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ පුරවැසියකු වීම අවසන් වී ඇත්නම් ;

(ඇ) ඔහු ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් නියම කරන ලද සිරභාරගත කිරීමේ දඬුවමක් විඳී නම් නැතහොත් විඳ ඇත්නම්.

සාමාජිකයන්ගේ ධුර කාලය.

6. (1) සභාවේ ලේකම්වරයා හැර එහි සෑම සාමාජිකයකුම මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා ධුරය හිස් කළහොත් මිස අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(2) (3) වන උපවගන්තිය යටතේ ඉවත් කරන ලද සාමාජිකයකු හැර අනෙකුත් සෑම සාමාජිකයකු ම නැවත පත් කරනු ලැබීමට සුදුසුකම් ලබන නමුත් කිසිම අවස්ථාවක දී අනුගාමී ධුර කාල තුනක් සඳහා සාමාජිකයකු පත නොකරනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා අවශ්‍ය යයි සලකන්නේ නම්, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් ඔහු විසින් කිසිදු හේතුවක් නොදක්වා යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) අමාත්‍යවරයා වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් සාමාජිකයකුට කවර හෝ අවස්ථාවක, සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය. ඉල්ලා අස්වන සාමාජිකයාට ඔහුගේ ඉල්ලා අස්වීම පිළිගත් බව අමාත්‍යවරයා විසින් ලිඛිතව දන්වා යවන තෙක්, මේ උපවගන්තිය යටතේ වූ ඉල්ලා අස්වීමක් ක්‍රියාත්මක නොවිය යුතු ය.

(5) සභාවේ සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නිසා ධුරය හිස්වූ අවස්ථාවක අමාත්‍යවරයා විසින් 4 වන වගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත්ව එකී සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු පත්කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන සාමාජිකයකු සිය පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(7) රෝගී බව, දුබලතාව හෝ මාස තුනකට අඩු නොවන කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුකොට තාවකාලිකව සිය ධුරයේ කාර්ය ඉටුකිරීමට සභාවේ සාමාජිකයකුට නොහැකි වන කල්හි, ඔහු ඒ බව අමාත්‍යවරයාට ලිඛිතව දැනුම් දිය යුතු අතර, අමාත්‍යවරයා විසින් 4 වන වගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත්ව එකී සාමාජිකයා වෙනුවට වැඩ බැලීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

සභාවේ සභාපතිවරයා.

7. (1) සභාවේ සභාපතිවරයා එහි සාමාජිකයන් විසින් තෝරා ගත යුතු ය.

(2) රෝගී බව, වෙනත් දුබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා සභාපතිවරයාට තම ධුරයේ කාර්ය ඉටුකිරීමට නොහැකි වේ නම් ඔහු වෙනුවට වැඩ බැලීමට වෙනත් සාමාජිකයකු සභාව විසින් පත්කළ හැකි ය.

(3) අමාත්‍යවරයා වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් සභාපතිවරයාට සභාපති ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) සභාපතිවරයාගේ ධූර කාලය සභාවේ සාමාජිකයකු වශයෙන් වූ ඔහුගේ ධූර කාලය විය යුතු ය.

(5) සභාපතිවරයා සභාවේ සියලු රැස්වීම්වල මූලසුන දැරිය යුතුය. එවැනි රැස්වීමකට සභාපතිවරයා පැමිණ නැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරෙන් කෙනෙකු එහි මූලසුන ගැනීමට පත්කර ගත යුතු ය.

(6) යම් රැස්වීමක සභාපතිවරයාට හෝ මූලසුන දරන සාමාජිකයාට තමාගේ ම ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

සාමාජිකයකු පත් කිරීමෙහි ලා වූ දෝෂයක් හේතුවෙන් සභාවේ ක්‍රියා හෝ කටයුතු අවලංගු නොවන බව.

8. සභාවේ සාමාජික ධූරවල යම් පුරප්පාඩුවක් තිබුන ද සභාවට ක්‍රියා කිරීමේ බලය තිබිය යුතු අතර එවැනි යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ සාමාජිකයකු පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් පමණක් සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු නොවිය යුතු ය ; අවලංගු වූවා සේ නොසැලකිය යුතු ය.

සභාවේ මුද්‍රාව.

9. (1) සභාවේ මුද්‍රාව, සභාවේ ලේකම්වරයාගේ භාරයේ තිබිය යුතු අතර සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) සභාපතිවරයා සහ ලේකම්වරයා ඉදිරිපිට දී හැර, කිසිම සාධන පත්‍රයකට හෝ ලියවිල්ලකට මුද්‍රාව නොතැබිය යුතුය. තවද තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් ඒ සාධන පත්‍රයෙහි හෝ ලියවිල්ලෙහි අත්සන් තැබිය යුතු ය.

(3) සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ නොමැති කල්හි සභාවේ වෙනත් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මුද්‍රාව තබනු ලැබිය හැකි ය. තවද තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් ඒ සාධන පත්‍රයෙහි හෝ ලියවිල්ලෙහි අත්සන් කළ යුතු ය.

(4) සභාවේ මුද්‍රාව තබන ලද සාධන පත්‍රවල හා ලියවිලිවල ලේඛනයක්, සභාව විසින් පවත්වා ගෙන යා යුතු ය.

සභාවේ කර්තව්‍ය.

10. සභාවේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය :—

(අ) කෘෂිකාර්මික පර්යේෂණ සංවිධාන කිරීම, සමායෝජනය, සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ සියලු කරුණු ද අමාත්‍යවරයා විසින් තමන්ට යොමු කරනු ලබන වෙනත් අදාළ කරුණු ද ගැන ආණ්ඩුවට උපදෙස් දීම ;

(ආ) ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තිය හා ප්‍රමුඛතා සකස් කිරීම ;

(ඇ) ජාතික සංවර්ධනයේ අරමුණු සාක්ෂාත් කරගැනීමේ අටියෙන් කෘෂිකාර්මික පර්යේෂණය පිළිබඳ පුළුල් පරමාර්ථ නිශ්චය කිරීම ;

(ඇ) කෘෂිකාර්මික පර්යේෂණ ආයතනවලට හා සංවිධානවලට අවශ්‍ය මූල්‍ය, මිනිස්බල හා භෞතික සම්පත් හා ඒ ආයතනවල හා සංවිධානවල කාර්ය මණ්ඩලවල සේවා නියමයන් හා කොන්දේසි සම්බන්ධයෙන් උචිත අධිකාරීන්ට නිර්දේශ කිරීම ;

(ඉ) ආයතනවල හා දෙපාර්තමේන්තුවල කෘෂිකාර්මික පර්යේෂණ වැඩ සටහන් සමාලෝචනය කිරීම හා ඒවායේ ප්‍රමුඛතා හා මුදල් සපයා ගැනීම ගැන මුදල් හා ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයට නිර්දේශ කිරීම ;

(ඊ) කෘෂිකාර්මික පර්යේෂණ කටයුතුවල විශිෂ්ටතාව නංවාලීම හා ඒ සඳහා පහසුකම් ඇති කිරීම ;

(උ) කෘෂිකාර්මික පර්යේෂණ ආයතන හා ආණ්ඩුව අතර අදහස් හුවමාරු කරගැනීමේ මාර්ගයක් වශයෙන් ක්‍රියා කිරීම ;

(ඌ) අන්තර් ආයතනික කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති සඳහා කටයුතු සැලසීම හා මුදල් සැපයීම ;

(එ) සමස්ත කෘෂිකාර්මික පර්යේෂණ අංශය සඳහා විශේෂ විද්‍යාත්මක සේවාවන් සම්බන්ධයෙන් කටයුතු සැලසීම හා මුදල් සැපයීම ;

(ඒ) ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් කෘෂිකාර්මික පර්යේෂණ ආයතන අතර සම්බන්ධතාව නංවාලීම ;

(ඔ) කෘෂිකාර්මික පර්යේෂණයට අදාල ජාත්‍යන්තර, ජාතික හා අන්තර් ආයතනික ප්‍රශ්න ගැන සාකච්ඡා හා සම්මන්ත්‍රණ සංවිධාන කිරීම ;

(ඕ) කෘෂිකාර්මික පර්යේෂණ කාර්ය මණ්ඩලයන්හි පශ්චාත් උපාධි පුහුණුව සඳහා ද විදේශයන්හි පිළිගත් පර්යේෂණ ආයතන සමග විද්‍යාඥයින් හුවමාරු කර ගැනීම් සඳහා ද කටයුතු සැලසීම ; සහ

(ක) කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති, ආයතන හා අංශ පිළිබඳ කාර්ය සාධනය කලින් කල සමාලෝචනය කිරීම.

**11.** පහත සඳහන් බලතල සභාව සතු වන අතර ඒ සියල්ල හෝ ඉන් කිසිවක් හෝ සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය :— *සභාවේ බලතල.*

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් කවර වූ හෝ ආකාරයකින් අත්කර ගැනීම, දැරීම හා එය විකිණීම, බදුදීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම ;

(ආ) යම් බැංකුවක හෝ බැංකුවල යම් ජංගම, ඉතිරි කිරීමේ හෝ තැන්පතු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම හා වසා දැමීම ;

(අ) සභාවේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ සපුරාලීම සඳහා අවශ්‍ය සියලු කිරීම් ඇති කර ගැනීම;

(ආ) සභාව තීරණය කරන ශිෂ්‍යත්ව ප්‍රදානපත්‍රවල එහි මුද්‍රා ආරෝපනය කිරීම;

(ඉ) සභාවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම හා ඔවුන් පිළිබඳ විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(ඊ) සභාවේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම;

(උ) සභාවේ කටයුතු කාර්යක්ෂම ලෙස කිරීම සඳහා පැවරීමට අවශ්‍ය යැයි සභාව සලකන කර්තව්‍ය සභාවේ යම් සාමාජික යකුට, ලේකම්වරයාට, නිලධරයකුට හෝ සේවකයකුට පැවරීම; හා

(ඌ) මේ පනතේ නිශ්චිතව විධිවිධාන සලසා නැති, සභාවේ හෝ එහි යම් කමිටුවක හෝ රැස්වීම් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ යම් කරුණක් පිළිබඳව රීති සෑදීම.

## II වන කොටස

## සභාවේ කාර්ය මණ්ඩලය

සභාවේ ලේකම්වරයා.

12. (1) සභාවේ ලේකම්වරයා, සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය. පළමුවන ලේකම්වරයා පත් කිරීම සම්බන්ධයෙන් ඒ නිර්දේශය අවශ්‍ය නොවිය යුතු ය.

(2) මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා ලේකම්වරයා විසින් ධුරය හිස කිරීමේදී, නැතහොත් ඔහු රෝගාතුරවීම හෝ වෙනත් හේතුවක් මත, තාවකාලිකව තම කාර්ය ඉටු කිරීමට ඔහුට නොහැකි වන කල්හි, අවස්ථාවෝචිත පරිදි, අලුත් පත්වීමක් කෙරෙන තෙක් හෝ ලේකම්වරයා නැවත කාර්ය භාර ගන්නා තෙක් ඔහු වෙනුවට වැඩ බැලීමට යෝග්‍ය හා සුදුසු පුද්ගලයකු, සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධානවලට යටත්ව, සභාවේ රැස්වීම් කැඳවීම, හා සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

(4) සභාවේ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍යයැයි සභාව සලකන එහි බලතල, කාර්ය හා කර්තව්‍ය සභාව විසින් ලේකම්වරයා වෙත පවරනු ලැබිය හැකි ය.

(5) සභාවේ හෝ එහි යම් කමිටුවක යම් රැස්වීමකදී කථා කිරීමට ලේකම්වරයාට හිමිකම් තිබිය යුතුය. එසේ වුවත් ඒ යම් රැස්වීමකදී ඡන්දය දීමට ඔහුට හිමිකම් නොමැති විය යුතු ය.

13. ලේකම්වරයා සභාවේ සාමාන්‍ය විධාන කිරීම යටතේ පහත සඳහන් කර්තව්‍ය ඉටු කළ යුතු ය :— 	ලේකම්වරයාගේ කර්තව්‍ය.

(අ) සභාවේ සියලු රැස්වීම්වල වාර්තා පිළියෙල කර බෙදා හැරීම ;

(ආ) සභාවේ වැඩ කටයුතුවලට අදාළ විෂයයන් පිළිබඳ ලියවිලි පිළියෙල කිරීම හෝ පිළියෙල කරවීම ;

(ඇ) කෘෂිකාර්මික පර්යේෂණයට සම්බන්ධ සියලු ආයතනවල හා සංවිධානවල කෘෂිකාර්මික පර්යේෂණයෙහි නියුක්ත තැනැත්තන්ගේ ලේඛනයක් පවත්වා ගෙනයාම ;

(ඈ) සභාපතිවරයා විමසා සභාවේ අයවැය ලේඛනය පිළියෙල කිරීම ;

(ඉ) පර්යේෂණ වැඩ සටහන් සකස් කිරීම, ව්‍යාපෘති පිළියෙල කිරීම, පර්යේෂණ ව්‍යාපෘති හා වැඩ සටහන් සමීක්ෂණය කිරීම හා අගැයීම සඳහා ක්‍රමෝපක්‍රම වර්ධනය කිරීමෙහි ලා සහ කෘෂිකාර්මික පර්යේෂණ කළමණාකරණය කිරීමෙහි ලා කෘෂිකාර්මික පර්යේෂණයෙහි නියුක්ත ආයතනවලට හා සංවිධානවලට සහාය වීම ;

(ඊ) කෘෂිකාර්මික පර්යේෂණයේ විවිධ අංශ පිළිබඳව සම්මන්ත්‍රණ, වැඩමුළු හා සම්මේලන සංවිධාන කිරීම ;

(උ) කෘෂිකාර්මික පර්යේෂණයට හෝ යම් කෘෂිකාර්මික පර්යේෂණ ආයතනයකට හෝ සංවිධානයකට සම්බන්ධ යම් ව්‍යාපෘති සමාලෝචනය කිරීම හෝ අගැයීම සඳහා යොදා ගත ලබන සමාලෝචන කණ්ඩායම් හා උපදේශකවරුන් සඳහා වූ නිර්ණේය විෂයයන් කෙටුම්පත් කිරීම ;

(ඌ) කෘෂිකාර්මික පර්යේෂණය හා පර්යේෂණ සඳහා මුදල් සැපයීම සම්බන්ධයෙන් පොත්පත් පළ කිරීමට සහායවීම හා එකී පොත්පත් පළ කරන ආයතනවල කටයුතු සමායෝජනය කිරීම ;

(එ) දියුණු නිෂ්පාදන ක්‍රමවලට අදාළ තොරතුරු විසුරුවා හැරීම පිණිස ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ලබාදීම.

14. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව සභාව විසින්— 	සභාවේ කාර්ය භාරය.

(අ) එහි කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමට අවශ්‍ය යැයි සභාව සල කන නිලධරයන් හා සේවකයන් පත්කිරීම හා ඒ නිලධර යන් හා සේවකයන් පිළිබඳ විනය පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ආ) ඒ නිලධරයනට හා සේවකයනට ගෙවිය යුතු පාරිශ්‍රමික අනු ප්‍රමාණ නියම කිරීම ;

(ඇ) ඒ නිලධරයන්ගේ හා සේවකයන්ගේ සේවා නියමයන් හා කොන්දේසි තීරණය කිරීම; හා

(ඈ) නිලධරයන්ගේ හා සේවකයන්ගේ යහපත සඳහා අර්ථසාධක අරමුදල් හෝ යෝජනා ක්‍රම පිහිටුවීම, විධිමත් කිරීම හා සභාවේ මුදල්වලින් එවැනි යම් අරමුදලකට දායක මුදල් ගෙවීම

කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කවර හෝ කරුණක් හෝ සියලු කරුණු සඳහා හෝ සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය. ඒ උපවගන්තියේ (ඈ) ඡේදයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සාදනු ලබන රීති 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධානවලට හෝ ඒ යටතේ වූ යම් නියෝගවලට හෝ අනනුකූල නොවිය යුතු ය.

සභාවේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත්කිරීම.

15. (1) සභාවේ ඉල්ලීම මත, රජයේ සේවයේ නියුක්තව සිටින යම් නිලධරයකු, ඒ නිලධරයාගේ හා රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව සභාව විසින් එවැනිම කැමැත්ත ඇතිව තීරණය කළ හැකි කාල පරිච්ඡේදයක් සඳහා සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කිරීම හෝ එවැනිම කැමැත්ත ඇතිව ස්ථිරව පත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලබන රජයේ සේවයේ යම් නිලධරයකු කෙරෙහි හා සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු අතර, ඉහතකී 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන රජයේ සේවයේ යම් නිලධරයකු කෙරෙහි හා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(3) සභාවේ ඉල්ලීම මත පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු හෝ අවස්ථාවෝචිත පරිදි, එකී සාමාජිකයාගේ හෝ නිලධරයාගේ හෝ සේවකයාගේ හා පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ හෝ එම පළාත් පාලන ආයතනයේ හෝ කැමැත්ත ඇතිව, සභාව විසින් එවැනිම කැමැත්ත ඇතිව තීරණය කරනු ලබන කාල පරිච්ඡේදයක් සඳහා සභාවේ කාර්ය මණ්ඩලයට, තාවකාලිකව පත් කිරීම හෝ එවැනිම කැමැත්ත ඇතිව සභාව සහ පළාත් පාලන සේවා කොමිෂන් සභාව හෝ පළාත් පාලන ආයතනය එකඟවිය හැකි විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියමයන් හා කොන්දේසි ඇතුළු නියමයන් හා කොන්දේසි මත ස්ථිරව පත්කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය ප්‍රකාර යම් තැනැත්තකු සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබූ විට, ඔහු ද ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් කවර හෝ සාමාජිකයකු යටත් වන විනය පාලනයටම යටත් විය යුතු ය.

(5) නිශ්චිත කාලපරිච්ඡේදයක් ආණ්ඩුවට සේවය කරන බවට ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු සභාව විසින් සේවයේ නියුක්ත කරනු ලබන කල්හි ඒ තැනැත්තා විසින් සභාවේ සේවය කරනු ලබන යම් කාල පරිච්ඡේදයක් ඒ ගිවිසුමේ වගකීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට සේවය කරන ලද කාල පරිච්ඡේදයක් ලෙස සැලකිය යුතු ය.

(6) රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු හෝ ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ හා ඒ සංස්ථාවේ පාලන මණ්ඩලයේ කැමැත්ත ඇතිව අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියමයන් හා කොන්දේසි ඇතුළුව ඒ සංස්ථාවේ පාලක මණ්ඩලය හා සභාව එකඟ වන නියමයන් හා කොන්දේසි මත තාවකාලිකව හෝ ස්ථිරව හෝ සභාවේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය.

(7) යම් තැනැත්තකු (6) වන උපවගන්තිය යටතේ තාවකාලිකව හෝ ස්ථිරව හෝ සභාවේ කාර්ය මණ්ඩලයට පත්කරනු ලබන අවස්ථාවක කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ඔහු ද යටත් විය යුතු ය.

## III වන කොටස

## මුදල්

16\. (1) මේ පනතේ කාර්ය සඳහා මේ පනතේ විධිවිධානවලට අනුකූලව සභාව විසින් පරිපාලනය කෙරෙන (මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ අරමුදල පිහිටුවනු ලැබිය යුතු ය. සභාවේ අරමුදල.

(2) මේ අරමුදලට—

(අ) සභාවේ පරිහරණය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේදී, ඉටු කිරීමේදී හා සපුරාලීමේදී සභාවට ලැබෙන සියලු මුදල් ; හා

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කවර හෝ ප්‍රභවයකින් ණය හෝ පරිත්‍යාග හෝ ත්‍යාග හෝ ප්‍රදාන හෝ වශයෙන් සභාවට ලැබෙන සියලු මුදල්

බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ, සභාව ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේදී, ඉටු කිරීමේදී හා සපුරාලීමේදී දරන වියදම් හෝ මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් මගින් අරමුදලින් ගෙවීමට නියම කරන ලද හෝ බලය දෙන ලද වෙනත් යම් වියදමක් හෝ පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

17. සභාව විසින් ආනයනය කරනු ලබන හෝ මිලදී ගනු ලබන යම් භාණ්ඩ සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමට හා සපුරාලීමට ඉවහල් වන බව අමාත්‍යවරයා සලකන්නා වූ ද, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා ඒ භාණ්ඩ බදුවලින් නිදහස් කිරීම අනුමත කරන්නා වූ ද අවස්ථාවක සභාව විසින් ආනයනය කරනු ලබන හෝ මිලදී ගනු ලබන භාණ්ඩ වෙනුවෙන් ගෙවිය යුතු රේගු බදු හෝ දේශීය බදු ගෙවීමෙන් සභාව නිදහස් වන්නේ ය. රේගු බදු යනාදියෙන් නිදහස් කිරීම.

18. (1) සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. මුදල් වර්ෂය හා සභාවේ ගිණුම් විගණනය.

(2) සභාව විසින් අරමුදලේ ආදායම හා වියදම, වත්කම් හා බැර කම් හා අනෙක් සියලු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවේ විධිවිධාන අරමුදලේ ගිණුම් විගණනය කිරීමට අදාළ විය යුතු ය.

## IV වන කොටස

## සාමාන්‍ය කරුණු

19. (1) සභාව යටත් පිරිසෙයින් හය මාසයකට වරක් රැස්විය යුතු අතර එහි යම් රැස්වීමක ගණපූරණය පස් දෙනෙකු විය යුතු ය. සභාවේ රැස්වීම.

(2) සභාවේ යම් රැස්වීමකදී තීරණය කරනු ලබන ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරයක ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

(3) සභාවේ රැස්වීම්වලට සහභාගිවීම සම්බන්ධයෙන් සාමාජික යනට පාරිශ්‍රමික ගෙවීම මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන අනු ප්‍රමාණ මත අරමුදලින් කරනු ලැබිය යුතු ය.

(4) ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා සපුරාලීම සඳහා සභාව අවශ්‍ය යයි සලකන ස්ථාවර කාරක සභා හෝ යථා යෝග්‍ය කාරක සභා හෝ සභාව විසින් පත් කරනු ලැබිය හැකි ය. ඒ කාරක සභාවලට සභාවේ සාමාජිකයන් නොවන තැනැත්තන් ඇතුළත් විය හැකි ය.

(5) සභාව විසින් ස්ථාවර කාරක සභා හෝ යථා යෝග්‍ය කාරක සභා පත්කරනු ලැබූ අවස්ථාවක එකී කාරක සභාවල රැස්වීම්වලට සහභාගි වන සාමාජිකයනට, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන අනු ප්‍රමාණ මත අරමුදලින් පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

(6) සභාව විසින් ස්වකීය බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් (4) වන උපවගන්තියෙහි සඳහන් කාරක සභාවලට පවරනු ලැබිය හැකි අතර එවැනි පැවරීමක් කර තිබියදී ද එසේ පවරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් සභාව විසින් ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හෝ සපුරාලීම කරනු ලැබිය හැකි ය.

20. අමාත්‍යවරයා විසින් ප්‍රතිපත්ති පිළිබඳ කරුණුවලට අදාළව සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටුකිරීමට හා සපුරාලීමට ඉවහල් වන සාමාන්‍ය හෝ විශේෂ විධාන, සභාව විමසා, ලිඛිතව සභාවට දෙනු ලැබිය හැකි ය. තවද සභාව විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. අමාත්‍ය වරයාගේ විධාන.

21. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා සභාවේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය. සභාවේ සාමාජිකයන් නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලබන බව.

22. සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය. අල්ලස් පනතේ අර්ථානුකූලව සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලබන බව.

23. (1) (අ) සභාව විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරනු ලබන හෝ කිරීමට අදහස් කරනු ලබන, යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් සභාවට විරුද්ධව ; හෝ මේ පනත යටතේ හෝ සභාවේ විධාන අනුව කෙරෙන ක්‍රියා සඳහා ආරක්ෂාව.

(ආ) සභාවේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු හෝ සේවකයකු හෝ නියෝජිතයකු හෝ විසින් සද්භාවයෙන් මේ පනත යටතේ හෝ සභාවේ විධාන අනුව කරනු ලබන හෝ කිරීමට අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් වෙනුවෙන් ඔහුට විරුද්ධව හෝ.

සිවිල් හෝ අපරාධ නඩුවක් නොපවරනු ලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ සභාව විසින් හෝ සභාවට විරුද්ධව හෝ පවරනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුවක් වෙනුවෙන් සභාවට දැරීමට සිදුවන වියදම්, අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර ඒ සිවිල් හෝ අපරාධ නඩුවකදී සභාවට ගෙවනු ලබන හෝ සභාව විසින් අයකර ගනු ලබන නඩු ගාස්තු වෙතොත් ඒවා අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ සභාවේ විධාන යටතේ කරනු ලබන හෝ අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් වෙනුවෙන්, යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී දරන්නට සිදුවන වියදම් කිසිවක් වේනොත්, ඒ වියදම් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බවට අධිකරණය තීරණය කරන්නේ නම්, ඔහු විසින් එකී සිවිල් හෝ අපරාධ නඩුවේදී අයකර නොගතහොත් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සභාවේ සාමාජික යෙකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළ විෂයෙහි රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

24. සභාවට විරුද්ධව ගෙනෙන යම් නඩුවක දී සභාවේ යම් සාමාජිකයෙකුට විරුද්ධව, පෞද්ගලිකව නැතහොත් ඔහුගේ දේපළ විෂයෙහි රිට් ආඥාවක් නිකුත් නොකරනු ලැබිය යුතු ය.

රීති සෑදීමෙහි ලා සභාවේ බලතල.

25. (1) රීති සෑදීමට මේ පනතින් බලය දෙනු ලබන නැතහොත් නියම කරනු ලබන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සභාව විසින් සාදනු ලබන රීති, ඒවා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ, ඒ අනුමැතිය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තෙක්, ක්‍රියාත්මක නොවිය යුතු ය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

26. (1) සභාවේ යම් නිශ්චිත කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම අවශ්‍ය වූ විට ඒ කාර්යය සඳහා යෝජිත අත්කර ගැනීම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ පසු ඒ දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය බව සැලකිය යුතු ය. තවද ඒ අනුව ඒ දේපළ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගෙන සභාවට පවරනු ලැබිය හැකි ය.

(2) සභාව සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් මුදලක් සභාව විසින් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

රජයට අයත් චංචල හා නිශ්චල දේපළ සභාවට ලබා දිය යුතුය.

27. (1) සභාවේ කාර්ය සඳහා රජයේ යම් නිශ්චය දේපළක් අවශ්‍ය වන අවස්ථාවකදී ඒ කාර්යය, රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ, ඒ දේපළ පිළිබඳ විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් දෙනු ලැබිය හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, එම ආඥාපනතේ විධිවිධාන, සභාවට ඒ දේපළ පිළිබඳ විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් දීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) සභාවේ කාර්ය සඳහා රජයේ යම් චංචල දේපළක් අවශ්‍ය වන අවස්ථාවකදී, ඒ චංචල දේපළ පිළිබඳ සන්තකය හා පරිහරණය, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් සභාව වෙත පවරා එය සතු කිරීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි ය.

28. (1) මේ පනත යටතේ සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටුකිරීමට හා සපුරාලීමට සභාවට හැකිවන පිණිස සභාව විසින් හෝ තත් කාර්ය සඳහා සභාව විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ ලිඛිත නිවේදනයක් මගින්, ඒ නිවේදනයෙහි නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේදය තුළ, ඒ නිවේදනයේ නිශ්චිතව සඳහන් සියලු වාර්තා සහ තොරතුරු සභාව වෙත හෝ සභාව විසින් බලය දෙනු ලැබූ තැනැත්තා වෙත හෝ සපයන ලෙස, කෘෂිකාර්මික පර්යේෂණයෙහි නිරත යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

වාර්තා සහ තොරතුරු.

(2) (1) වන උපවගන්තිය යටතේ නිවේදනයකින් යම් වාර්තාවක් හෝ තොරතුරු සැපයීමට නියම කරනු ලැබූ යම් තැනැත්තකු යම් පනතක විධිවිධාන යටතේ ඒ වාර්තාව හෝ තොරතුරු සැපයීමෙන් වළකනු ලබන්නේ නම් මිස, ඒ නිවේදනයේ සඳහන් කාලය තුළ, ඒ නිවේදනයේ නියමයට අනුකූලව ක්‍රියාකිරීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන නිවේදනයක නියමයන්ට අනුකූලව (1) වන උපවගන්තිය යටතේ සපයනු ලබන වාර්තාවක අඩංගු කිසිදු තොරතුරක්, ඒ වාර්තාව හෝ තොරතුරු සපයන තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ සභාවේ කර්තව්‍යයන් ඉටු කිරීමේදී විනා සභාව විසින් ප්‍රසිද්ධ කිරීම හෝ වෙනත් තැනැත්තකුට දැනුම් දීම හෝ නොකරනු ලැබිය යුතු ය.

29. සභාව විසින් වර්ෂය තුළ කරන ලද කටයුතු පිළිබඳ වාර්තාවක් එක් එක් මුදල් වර්ෂය අවසානයේදී සභාව විසින් පළ කරනු ලැබිය යුතු අතර, එය අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයා ඒ වාර්තාව අනුමත කළ පසු එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

සභාව එහි කටයුතු පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බව.

30. (1) (අ) මේ පනතේ යම් විධිවිධාන උල්ලංඝනය කරන;

(ආ) 28 වන වගන්තිය යටතේ තමා වෙත එවනු ලැබූ නිවේදනයක නියමයන්ට අනුකූලව තමා විසින් සපයනු ලබන යම් වාර්තාවක හෝ තොරතුරක, දැනුවත්ව කිසිදු ව්‍යාජ හෝ සාවද්‍ය ප්‍රකාශයක් කරන;

(ඇ) 28 වන වගන්තිය යටතේ තමා වෙත එවනු ලැබූ යම් නිවේදනයක නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන;

(ඈ) සභාවේ සාමාජිකයෙකු හෝ නිලධරයෙකු හෝ සේවකයෙකු වශයෙන් මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී හෝ කාර්ය ඉටු කිරීමේදී හෝ කර්තව්‍යයන් සපුරාලීමේදී

වැරදි සහ දඬුවම.

හෝ ඒ සම්බන්ධයෙන් හෝ ලබාගන්නා තොරතුරු කිසිවක් මේ පනතින් එකී තොරතුරු එළිදරව් කිරීමට තමාට බලය දෙන ලද කාර්ය යක් හැර වෙනත් යම් කාර්යයක් සඳහා එළිදරව් කරන සෑම තැනැත්තකුම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තකුම මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමේදී රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(3) පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වූ වරදක් කරනු ලබන අවස්ථාවක දී—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු හා නිලධරයකු ;

(ආ) පුද්ගල මණ්ඩලය, ව්‍යාපාර ආයතනයක් නම් ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකු

වරදට වරදකරුවන් වන බව සැලකිය යුතුය :

එසේ වුවද, ඒ වරද කරන ලද්දේ තමන් නොදැනුවත්ව බව, නැතහොත් ඒ වරද වැළැක්වීමට තමා පූර්ණ උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව ඔප්පු කළහොත්, ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවකු හෝ ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

අර්ථ නිරූපනය.

**31.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි,

"කෘෂිකාර්මික පර්යේෂණය" යන්නෙහි, පශු සම්පත් නිෂ්පාදනය, වන විද්‍යාව, ධීවර කර්මාන්තය සහ කෘෂි කර්මාන්ත යට සම්බන්ධ කර්මාන්ත පිළිබඳ පර්යේෂණ ඇතුළත් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් නගර සභාවක්, මහ නගර සභාවක් හෝ සංවර්ධන සභාවක් අදහස් වේ.